සියලුම හිමිකම්ඇවිරිණි/All Right Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Southern Provincial Department of Education

අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය 12 ශ්‍රේණිය
තෙවන වාර පරීක්ෂණය 2019 ජූලි
கல்விப் பொதுத் தராதர(உயர்தரப்)பரீட்சை 2019 ஜூலை 12 தரம் மூன்றாம் தவணைப் பரீட்சை
General Certificate of Education (Adv.Level) Grade 12 Third Term Test 2019 July

භූගෝල විද්‍යාව - I
Geography - I

22 S I

කාලය පැය තුනයි
03 hours

නම………………………………………………….. 12 ශ්‍රේණිය…………..

**සැලකිය යුතුයි**

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් **තුනකින්** සමන්විත වේ. **I** කොටස බහුවරණ ප්‍රශ්න 40 න් යුක්ත වන අතර ඒවාට පිළිතුරු මෙම පත්‍රයේ ම සැපයිය යුතු ය.

**II** කොටසෙහි ප්‍රශ්න **දෙකට ම** පිළිතුරු සැපයිය යුතු ය. **III** කොටස ප්‍රශ්න **හතරකින්** සමන්විත වන අතර තෝරාගත් ප්‍රශ්න **දෙකකට** පමණක් පිළිතුරු සැපයිය යුතු ය.

මෙම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම සඳහා ශ්‍රී ලංකා මෙට්‍රික් සිතියම් කොටසක් ද ලෝක ආකෘති සිතියමක් ද සපයනු ලැබේ.

## I කොටස

01.1:50000 හු ලක්ෂණ සිතියම්වල සැබෑ භූමියෙහි දැකිය නොහැකි නමුත් සිතියමෙහි පමණක් දැකිය හැකි ලක්ෂණ ඇතුළත් පිළිතුර වන්නේ

1.වැව,අප්‍රධාන මාර්ගය,සමෝච්ඡ රේඛා 2.වනාන්තර,වාරිමාර්ග ඇළ,සමගැඹුරුරේඛා
3.සමෝච්ඡ රේඛා,පරිපාලන මායිම්,ත්‍රිකෝණමිතික ස්ථාන 4.රක්ෂිත ප්‍රදේශය,ගංමෝය,වැව් බැම්ම
5.ත්‍රිකෝණමිතික ස්ථාන,ස්ථානීය උස,ගං දගරය (….)

02.1:50000 හු ලක්ෂණ සිතියම් සඳහා අඳින ලද රේඛීය පරිමාණයක පළමු කි.මී. 1 බෙදා දක්වනු ලබන අනු කොටස් ගණන දක්වෙන නිවැරදි පිළිතුර වන්නේ

1.මි.මී.දෙකෙන් දෙකටය 2.සෙ.මී.දෙකෙන් දෙකටය 3.සෙ.මී.එකෙන් එකටය
4.මි.මී.හතරෙන් හතරටය 5.සෙ.මී.හතරෙන් හතරටය (….)

03.ව.කි.මී.1000 ක වර්ගඵලයෙන් යුත් 1:50000 හු ලක්ෂණ සිතියමක උතුරු මායිමෙහි පිටත වම් කෙළවරෙහි දක්වා ඇත්තේ

1.සිතියම් වර්ගය 2.සිතියමෙහි මාතෘකාව 3.පත්‍ර අංකය
4.රේඛීය පරිමාණය 5.ජාතික ඛණ්ඩාංක (….)

04.1:50000 හු ලක්ෂණ සිතියම්වල ජලාශ නම් කිරීම සඳහා යොදාගෙන ඇති වර්ණය දක්වෙන නිවැරදි පිළිතුර වන්නේ

1.රතු 2.කළු 3.දුඹුරු 4.නිල් 5.අළු (….)

05.1:50000 හු ලක්ෂණ සිතියමක දිග සෙ.මී.12 ක් සහ පළල සෙ.මී. 8 ක් වන ප්‍රදේශයක සැබෑ භූමියේ වර්ගඵලය නිවැරදිව දක්වෙන පිළිතුර වන්නේ

1.ව.කි.මී.36 2.ව.කි.මී.24 3.2.ව.කි.මී.72 4.ව.සෙ.මී.72 5.ව.මී.36 (….)

06.1:50000 හු ලක්ෂණ සිතියම්වල ප්‍රධාන සමෝච්ඡ රේඛා දෙකක් අතර දුර නිවැරදිව දක්වා ඇති පිළිතුර වන්නේ

1.මී.100 2.මී.20 3.සෙ.මී.100 4.කි.මී.20 5.මි.මී.100 (….)

07.1:50000 හු ලක්ෂණ සිතියම්වල වර්ණ භාවිතයෙන් පමණක් දක්වෙන සංස්කෘතික ලක්ෂණයක් වන්නේ

1.ගුවන් තොටුපළ 2.ප්‍රදීපාගාරය 3.විශේෂිත ගොඩනැගිල්ල
4.ඓතිහාසික සිද්ධස්ථානය 5.ඉදිකළ ප්‍රදේශය (….)

08.1:50000 භූ ලක්ෂණ සිතියම්වල කිසියම් ස්ථානයක නිරපේක්ෂ පිහිටීම ප්‍රකාශ කරන ක්‍රමවේදය දැක්වෙන නිවැරදි පිළිතුර වන්නේ

1.ගෝලීය ඛණ්ඩාංක අනුව 2.යාබද භූ ලක්ෂණ අනුව 3.රේඛීය පරිමාණය අනුව

4.ජාල උතුර හා චුම්භක උතුර අනුව 5.පරිපාලන සීමා අනුව (….)

09.නවීන සිතියම් විද්‍යාත්මක ශිල්පීය ක්‍රම මගින් අංකිත සිතියම් බහුල වශයෙන් නිර්මාණය වීම කෙරෙහි බල පා ඇති තීරණාත්මක සාධකය වන්නේ

1.තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණයේ දියුණුව

2.සාකල්‍ය ප්‍රවේශයකින් භූගෝලවිද්‍යාත්මක කරුණු ඉදිරිපත් කිරීම

3.භූගෝලවිද්‍යාව උප විෂයය ක්ෂේත්‍රයන්ට බෙදා අධ්‍යයනය කිරීම

4.භෞතික භූගෝල විද්‍යාත්මක විෂයය කරුණු විද්‍යාත්මක ප්‍රවේශ ය කින් අධ්‍යයනය කිරීම

5.මානුෂ භූගෝලවිද්‍යා විෂයය ක්ෂේත්‍රය තුළ ඇති වූ නව ප්‍රවණතා (….)

10.භූගෝලීය දත්ත අංකිත දත්ත බවට පරිවර්තනය කොට පරිගණකයට ඇතුළත් කිරීමේදී අවශ්‍ය වන උපාංග යුගලය ඇතුළත්වන පිළිතුර වන්නේ

1.චුම්භක තැටි සහ සන්දර්ශකය 2.අංකන ඵලකය හා මුද්‍රණ යන්ත්‍රය

3.අංකන ඵලකය සහ සුපිරික්සනය 4.තිර සංඛ්‍යාංකනය සහ සන්දර්ශකය

5.චුම්භක තැටි සහ මුද්‍රණ යන්ත්‍රය (….)

11.භූගෝලීය තොරතුරු පද්ධතියක අඩංගු අවකාශීය දත්ත සඳහා උදාහරණයක් දැක්වෙන පිළිතුර වන්නේ

1.ප්‍රදේශයක ජන සංඛ්‍යාවේ ප්‍රමාණය 2.බෝග වගාවක බිම් ප්‍රමාණය

3.මාර්ගයක දිග 4.නගරය පිහිටීම

5.ගංගාවක දිග (….)

12.භූගෝලීය තොරතුරු පද්ධතියක් තුළ දත්ත ගබඩා කිරීමේ ක්‍රමවේදයක් යාබද රූප සටහනෙහි දක්වේ.එහි **A** ලෙස දක්වා ඇති ලක්ෂ්‍යයන්ගෙන් ප්‍රකාශ කළ හැකි ලක්ෂණයකට උදාහරණයක් වන්නේ




1.ගංගාව

2.දුම්රිය මාර්ගය

3.අධිවේගී මාර්ගය

4.නගරයක කසල ඒකරාශීකරන ස්ථාන

5.කෘෂිකාර්මික බෝගයක ව්‍යාප්තිය

(….)

13.භූගෝලීය තොරතුරු පද්ධති ක්‍රියාත්මක කිරීම සඳහා භාවිතා කරන පරිගණකවලට සුවිශේෂී වූ මෘදුකාංගයක් නොවන්නේ

1.MapInfo 2.Arcveiw 3.Arc GIS 4.Global Mapper 5.Excel (….)

14.ගෝලීය ස්ථානගත කිරීමේ පද්ධතියක් සම්බන්ධයෙන් ඉදිරිපත්වී ඇති ප්‍රකාශ අතුරින් නිවැරදි ප්‍රකාශය **නොවන්නේ**

1.මෙය භූගෝලීය තොරතුරු පද්ධතියකට දත්ත ලබා ගත හැකි එක් මූලාශ්‍රයකි.

2.මෙම පද්ධතිය මූලික උපාංග තුනකින් සමන්විත වේ.

3.සෑම GPS චන්ද්‍රිකාවක්ම තමන්ට පවරා ඇති කක්ෂයක පැයට කි.මී.11000 ක පමණ වේගයෙන් ගමන් කරයි.

4.සාමාන්‍යයෙන් චන්ද්‍රිකා 4ක් එක් කක්ෂ තලයක් පිරික්සීම සඳහා යොදවා ඇත

5.චන්ද්‍රිකා මගින් ලබා ගන්නා පෘථිවි ප්‍රතිබිම්බය ජාතික ඛණ්ඩාංක මගින් තම පිහිටීම නිවැරදිව පෙන්වා දෙයි (….)

15. GPS තාක්ෂණය යටතේ අත්ලන්තික් සාගරයේ පිහිටුවා ඇති මෙහෙයුම් මධ්‍යස්ථානය වන්නේ

1.හවායි දූපත් 2.ඇසෙන්ෂන් දූපත් 3. දියගෝ ගාෂියා දූපත් 4.ක්වාජලෙයින් දූපත්

5.කොලරාඩෝ ස්ප්‍රින්ග්ස් (….)

16.භූගෝල විද්‍යාත්මක විෂයය කරුණු අධ්‍යයනය කරනු ලබන ප්‍රවේශයක් විය **නොහැක්කේ**

1.සාකල්‍යය ප්‍රවේශය 2.ගෝලීය ප්‍රවේශය 3.ප්‍රාදේශීය ප්‍රවේශය

4.ස්ථානීය ප්‍රවේශය 5. ආගම්වාදී ප්‍රවේශය (….)

17.වායුගෝලීය හා ශිලාගෝලීය උප පද්ධතීන් අතර සිදුවන අන්තර් ක්‍රියාකාරීත්වය ක් ලෙස සැලකිය නොහැක්කේ

1.වාෂ්පීකරණය 2.භූ රසායනික චක්‍ර 3.ක්ෂරණය 4. ස්පර්ෂ විපරීතකරණය

5.පාංශු ජීරණය (….)

18.තාප ගෝලයේ උෂ්ණත්වය ඉහළ යැම කෙරෙහි බලපාන හේතුවක් ලෙස සැලකිය හැක්කේ

1.භූ විකිරණවල ක්‍රියාකාරිත්වය 2.ඕසෝන් ස්ථරයේ ක්‍රියාකාරීත්වය

3.විද්‍යුත් ආරෝපණවල ක්‍රියාකාරීත්වය 4.දූවිලි හා වළාකුළු නොමැතිවීම

5.ඉහළ වායු සාන්ද්‍රණයක් පැවතීම (….)

19.පහසුවෙන් ලබාගත හැකි මිරිදිය ජල ප්‍රමාණය 1% කි ඉන් පාංශු තෙතමනය ලෙස සැලකෙන ජල ප්‍රමාණය වන්නේ

1. 52% 2. 1% 3. 8% 4. 38% 5. 79% (….)

20.පෘථිවි අභ්‍යන්තර හරය සීමාවේ දී උෂ්ණත්වය සෙ.අං.6000 ක් ඉක්මවා යැමට හේතුවක් ලෙස සැලකිය හැක්කේ

1.පාෂාණවල අන්තර්ගත විකිරණශීලී මූලද්‍රවයයන්

2.සංවහන ධාරාවල ක්‍රියාකාරීත්වය

3.භූ කම්පන තරංගවල ක්‍රියාකාරීත්වය

4.ප්‍රාථමික තරංග වල ක්‍රියාකාරීත්වය

5.අභ්‍යන්තර පාෂාණ ජීරණය (….)

21.රසායනික වශයෙන් අවක්ෂේප වූ අවසාදිත පාෂාණයකට උදාහරණයක් ලෙස සැලකිය හැක්කේ

1.බොරළු 2.වැලිගල් 3.පීට් 4.ගල් අගුරු 5.ලිමොනයිට් (….)

22.භූ විද්‍යාත්මක ලක්ෂණයන්ට අනුව ශ්‍රී ලංකාවේ කතරගම කඳු ප්‍රදේශයේ ව්‍යාප්තව ඇති පාෂාණ අයත්වන පාෂාණ ශ්‍රේණිය වන්නේ

1.වන්නි සංකීරණය 2.උස්බිම් ශ්‍රේණිය 3.විජයානු සංකීරණය

4.මයෝසීන හුණුගල් ශ්‍රේණිය 5.පුරාසික ශ්‍රේණිය (….)

23.යාබද ශ්‍රී ලංකා සිතියමෙහි A සහ Bලෙස දක්වා ඇත්තේ ශ්‍රී ලංකාවේ මැණික් ව්‍යාප්ත ප්‍රදේශ දෙකකි. එය පිළිවෙළින් දක්වා ඇති පිළිතුර වන්නේ




1. A බුත්තල Bරඹුක්කන
2. A මහඔය Bකහටගස් දිගිලිය
3. A නෙටොල්පිටිය Bයුදගනාව
4. A ඇළහැර Bඔක්කම්පිටිය
5. A මින්නේරිය Bහොරොව්පොතාන

(….)

24.පෘථිවි මතුපිට පිහිට විශාලතම භූ රූප දක්වෙන පිළිතුර ලෙස සැලකිය හැක්කේ

1.මහාද්වීපික ස්කන්ධ හා සාගර ද්‍රෝණි

2.කඳුවැටි හා අක්‍රාන්ත යමහල් භූ රූප

3.කාන්තාර භූ රූප හා මහද්වීපික ස්කන්ධ

4.ගංගා භූ රූප හා සාගර තරංග මගින් නිර්මාණය වන භූ රූප

5.ග්ලැසියර් මගින් නිර්මාණය කරන භූ රූප සහ මහාද්වීපික ස්කන්ධ (….)

25.සමපීඩන චලන හේතුවෙන් නිර්මාණය වන සමානති නැම්මක දැකිය හැකි ලක්ෂණයක් දැක්වෙන පිළිතුර වන්නේ

1.නැමීම්වල බාහු එකිනෙකට ලම්බකව පිහිටීමයි
2.නැම්මෙහි එක් බාහුවක් ලම්බකව හා අනෙක් බාහුව ආනත ව පිහිටීමයි
3.නැම්මෙහි එක් බාහුවක් අනෙක් බහුව මත පිහිටීමයි
4.නැම්මෙහි අක්ෂය කඩින්කඩ විච්ඡේදනය වී පැවතීමයි
5.නැම්මෙහි එක් බාහුවක් අනෙක් බාහුව පසුකරමින් ගමන් කර තිබීමයි (….)

26.භූ කම්පනයක් ඇති වූ අවස්ථාවක දී පෘථිවි පෘෂ්ඨය කරා මුල් වරට ළඟාවන තරංගය හෝ තරංග විශේෂය වන්නේ

1. L තරංග  2. P තරංග  3. S තරංග  4. G තරංග
5. G තරංග (….)

27.පහත් දක්වා ඇත්තේ ගංගා ඛාදනය හේතුකොටගෙන නිර්මාණය වන භූ රූපයකි. එහි නිර්මාණ ක්‍රියාවලිය නිවැරදිව දක්වා ඇති පිළිතුර වන්නේ



1.මෙය ගංගාවක යෞවන අවස්ථාවේ නිර්මාණය වන භූ රූපයකි.
2.ගං දඟරයක පිටත ඉවුරු ඛාදනය වන අතර අතුළත ඉවුරු නිධි සාධනය වේ.
3.ගං දගරයක අතුළත ඉවුරු ඛාදනය වන අතර පිටත ඉවුරු නිධි සාධනය වේ.
4.ගං දගරයක අතුළත ඉවුරුවල ඛාදනය මෙන්ම නිධි සාධනය ද සිදුවේ.
5.ගං දගරයක පිටත ඉවුරු ස්ථාවරව පවතින අතර අතුළත ඉවුරුවල ඛාදනය මෙන්ම නිධි සාධනය ද සිදුවේ.

(….)

28.පහත දැක්වෙන්නේ කාන්තාර ප්‍රදේශයක නිර්මාණයවන වැලි වැටියක රූප සටහනකි. එහි ඊතලවලින් දක්වා ඇත්තේ සුළං දිශාවයි.එය නිවැරදිව දක්වා ඇති රූප සටහන වන්නේ




1. A පමණි  2. B පමණි  3. C පමණි  4. D පමණි  5. C සහ D යන දෙකම නිවැරදිය (….)

29.2019 වර්ෂයේ ලෝක පරිසර දින තේමාව නිවැරදිව දක්වා ඇති පිළිතුර වන්නේ

1.තිරසර වන කළමණාකරණය තුළින් වායු දූෂණය අවම කරීම
2.හරිතාගාර වායු විමෝචනය ස්ථාවර මට්ටමක පවත්වා ගැනීම
3.ප්ලාස්ටික් මගින් වන දූෂණයට එරෙහිව සටන් කිරීම
4.මිනිසා ස්වභාව ධර්මය වෙත සම්බන්ධ කිරීම
5.තෙත් බිම් කළමණාකරණය තුළින් වායු දූෂණය අවම කිරීම (….)

30.මෑතක් වනතුරුම අධි ජන සංකේන්ද්‍රණ කලාපයක් ලෙස සැලකුව ද වර්තමානයේ අධික ජන සංකේන්ද්‍රණ කලාපයක් ලෙස නොසලකන කලාපය ලෙස සැලකෙන්නේ

1.දකුණු ආසියාව 2.නැගෙනහිර ආසියාව 3. අග්නිදිග ආසියාව

4.වයඹ දිග යුරෝපය 5.ඊශාන දිග ඇමරිකා එක්සත් ජනපදය (….)

31.පහත දැක්වෙන්නේ ජන විද්‍යාත්මක පිරමීඩ කිහිපයකි. එහි ජන විද්‍යාත්මක විචල්‍යයන් නිවැරදිව දක්වා ඇති පිරමීඩය වන්නේ




P Q R S T

1.P 2.Q 3.R 4.S 5.T (….)

32.පහත A,B,C,D සහ Eදක්වා ඇත්තේ ලෝකයේ රටවල් කිහිපයක දළ උපත් අනුපාතිකයන්ය. මෙම රටවල් අතුරින් සංවර්ධිත රටක් සහ සංවර්ධනය වෙමින් පවතින රටක් පිළවෙළින් දැක්වෙන පිළිතුර වන්නේ

A. 8.07 B.46.2 C.8.1 D.19.89 E.21.89

1.CD 2.BA 3.AC 4.EC 5.DE (….)

33.ශ්‍රී ලංකාවේ වේගවත් ජන සංඛ්‍යා වර්ධනයක් සිදු වූ කාල වකවානුව ලෙස සැලකෙන්නේ

1.1946 -1971 2.1930 1976 3.1980 -2000 4.1960 2000 5.1965 2005 (….)

34.ශ්‍රී ලංකාවේ වර්තමාන ග්‍රාමීය සහ නාගරික ජන සංඛ්‍යාව නිවැරදිව පිළිවෙළින් දක්වා ඇති පිළිතුර වන්නේ

1.74.4% 38.2% 2.18.2% 74.4% 3.74.4% 18.2% 4.82.5% 48.6% 5.64.5% 22% (….)

35.ශ්‍රී ලංකාවේ සංවර්ධන ව්‍යාපෘති හේතුවෙන් ජනයා සංක්‍රමණය වූ දිස්ත්‍රික්ක ලෙස සැලකෙන්නේ

1.අම්පාර සහ හම්බන්තොට 2.කිලිනොච්චිය සහ මුලතිව් 3.යාපනය සහ මන්නාරම

4.මන්නාරම සහ ත්‍රිකුණාමලය 5.යාපනය සහ පොළොන්නරුව (….)

36.ශ්‍රී ලංකාවේ මෑත කාලීන ජනවිද්‍යාත්මක ප්‍රවණතාවක් ලෙෂ සැලකිය **නොහැක්කේ**

1.වයස්ගත ජන සංඛ්‍යාවේ වර්ධනය 2.ළමා ජන සංඛ්‍යාවේ වර්ධනය පහත වැටීම

3.ස්ත්‍රී ජන සංඛ්‍යාවේ වර්ධනය 4.ශ්‍රම බලකායේ සංකෝචනය

5.ශුද්ධ සංක්‍රමණ අනුපාතිකය ධන අගයක් ගැනීම (….)

37.ශ්‍රී ලංකාවේ අභ්‍යන්තර සංක්‍රමණවල වැඩිම දායකත්වයක් සපයන්නේ

1.වැඩිහිටි ජනසංඛ්‍යා 2.ළමා ජනසංඛ්‍යාව 3.ස්ත්‍රී ජන සංඛ්‍යාව

4.ශ්‍රම බලකාය 5.උසස් අධ්‍යාපනය ලබන සිසුන් (….)

38.ජනාවාස ධූරාවලියක ආරම්භය සහ අවසානය දක්වා ඇති නිවැරදි පිළිතුර වන්නේ

1.ගොවිපළ ගම නගරයාය 2.ගොවිපළ ගම නගර සාමූහිතය

2.පුරවරය සහ නගර සාමූහිතය 4.නගරයාය සහ නගර සාමූහිතය

5.මහ නගරය සහ නගර යාය (….)

39.වැව,පල්ලිය,වෙළඳපොළ කේන්ද්‍රකර ගනිමින් නිර්මාණය වන ජනාවාස වර්ගය දැක්වෙන පිළිතුර වන්නේ

1.හුදෙකලා ජනාවාස 2.නාභිගත ජනාවාස 3.රේඛීය ජනාවාස

4.වතු ජනාවාස 5.ධීවර ජනාවාස (….)

40.ශ්‍රී ලංකාවේ නාගරික ප්‍රදේශ හඳුනාගැනීමට යොදාගෙන ඇති පරිපාලනමය නිර්ණායකය වන්නේ

1.නගර සභාවලින් සහ මහනගර සභාවලින් පාලනය වන ප්‍රදේශ පමණක් නගර ලෙස හඳුනා ගැනීම

2.නගර සභාවලින් පමණක් පාලනය වන ප්‍රදේශ පමණක් නගර ලෙස හඳුනා ගැනීම

3.මහනගර සභාවලින් පමණක් පාලනය වන ප්‍රදේශ පමණක් නගර ලෙස හඳුනා ගැනීම

4.නාගරික සංවර්ධන අධිකාරිය මගින් පාලනය වන ප්‍රදේශ පමණක් නගර ලෙස හඳුනා ගැනීම

5.ප්‍රාදේශීය සභාවලින් පාලනය වන ප්‍රදේශ පමණක් නගර ලෙස හඳුනා ගැනීම (….)

ලකුණු 40

**II කොටස**

1.ශ්‍රී ලංකා මිනුම්දෝරු දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත්කරන ලද 1:50000 පරිමාණයේ මහියංගණ භූ ලක්ෂණ සිතියමේ කොටසක් ඔබට සපයා ඇත.එහි සමෝච්ඡ රේඛා අන්තරය මීටර් 20කි.එම සිතියම පදනම් කර ගනිමින් පහත දක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න

(i) සිතියමේ A-B සහ C-D රේඛාවලින් දක්වෙන භූ ලක්ෂණ **දෙක** නම් කරන්න (ලකුණු 02යි)

(ii) සිතියමේ P සහ Q ලෙස නම්කර ඇති සංස්කෘතික ලක්ෂණ නිවැරදිව නම් කරන්න (ලකුණු 02යි)

(iii) a.සිතියම්ගත ප්‍රදේශයේ ඊශාන දිග කාර්තුවෙහි ප්‍රධාන මාර්ගයේ සිට උතුරු මායිම දක්වා දිවෙන අප්‍රධාන මාර්ගයේ දුර කිලෝමීටර්වලින් ගණනය කරන්න (ලකුණු 01යි)

b.සිතියම්ගත ප්‍රදේශය සඳහා රේඛිය පරිමාණය ඇඳ දක්වන්න (ලකුණු 02යි)

c.සිතියම්ගත ප්‍රදේශයේ පරිපාලන මායිම් තීරණය කිරීමෙහිලා යොදාගෙන ඇති භෞතික සාධකය කවරක්ද ? (ලකුණු 02යි)

(iv) සිතියමේ L ලෙස දක්වා ඇති චතුරස්‍රයෙහි හඳුනාගතහැකි එම ප්‍රදේශයේ ජනයා වෙත සපයන සේවාවන් **තුනක්** සඳහන් කරන්න (ලකුණු 03යි)

(v) සමස්ථ සිතියම්ගත ප්‍රදේශයේ ජලවහනය පිළිබඳව කෙටියෙන් විස්තර කරන්න (ලකුණු 04යි)

(vi) සිතියම්ගත ප්‍රදේශයේ නැගෙනහිර අර්ධයෙහි ජන ව්‍යාප්තිය ඉහළ මට්ටමක පැවතීම කෙරෙහි බලපාන ලද සාධක **දෙකක්** විස්තර කරන්න (ලකුණු 04යි)

2.ඔබ වෙත සපයා ඇති ලෝක ආකෘති සිතියමෙහි පහත සඳහන් දෑ ලකුණු කර නම් කරන්න
(සම්මත හා නිවැරදි සිතියම් විද්‍යාත්මක ක්‍රම ද වර්ණ ද භාවිතා කිරීමට සැලකිලිමත් වන්න.)

(i) හවායි දූපත
(ii) බීරිං සමුද්‍ර සන්ධිය
(iii) ගිනි බොක්ක
(iv) මහා බෙදුම් කඳු වැටිය
(v) බෙංගුවෙලා ප්‍රවාහය
(vi) ටිටිකාකා විල
(vii) නැමීබියානු කාන්තාරය
(viii) ඩැනියුබ් ගංගාව
(ix) ඇලස්කාව
(x) රියෝද ජැනයිරෝ නගරය

(ලකුණු 10යි)

## III කොටස

මෙම කොටසින් ප්‍රශ්න **දෙකක්** පමණක් තොරාගෙන පිළිතුරු සපයන්න

03.(i) සේයා සිතියමක් යන්න කෙටියෙන් හඳුන්වන්න (ලකුණු 02)

(ii) සේයා සිතියම් මගින් නිරූපණය කළ හැකි විචල්‍යයන් **දෙකක්** සඳහන් කරන්න (ලකුණු 02)

(iii)භූ ලක්ෂණ සිතියම්වල භාවිතාවන දිශාවන් දළ රූප සටහන් අධාර කර ගනිමින් පැහැදිළි කරන්න (ලකුණු 03)

(iv) තිත් සිතියම් නිර්මාණයේ දී සිතියම් සකස් කරන්නෙකු විසින් අවධානය යොමු කළ යුතු ක්ෂේත්‍ර **දෙකක්** විස්තර කරන්න (ලකුණු 08)

04. (i) තේමා සිතියම් සඳහා උදාහරණ **දෙකක්** සඳහන් කරන්න (ලකුණු 02)

(ii) ශ්‍රී ලංකාවේ නිර්මාණය කර ඇති භූ ලක්ෂණ සිතියම් ශ්‍රේණි **දෙකක්** නම් කරන්න (ලකුණු 02)

(iii) භූ ලක්ෂණ සිතියමක සුවිශේෂී ලක්ෂණ **තුනක්** සඳහන් කරන්න (ලකුණු 03)

(iv) භූ ලක්ෂණ සිතියමක දක්නට ලැබෙන පහත ලක්ෂණ දළ සමෝච්ඡ රේඛා සටහන් ආධාර කරගනිමින් විස්තර කරන්න

1.උත්තල බෑවුම

2.වලයාකාර ජලවහන රටාව

3.කපොල්ල

4.ගංගා මණ්ඩලය (ලකුණු 08)

05.(i)පරිගණක හා චන්ද්‍රිකා ආශ්‍රයෙන් නිර්මාණය කරනු ලබන සිතියම් කවර නමින් හැඳින්වේ ද? (ලකුණු 02)

(ii)භූගෝලීය තොරතුරු පද්ධතියක් තුළ භාවිතා කෙරෙන ආදාන හා ප්‍රතිදාන උපාංග **එක** බැගින් දක්වන්න (ලකුණු 03)

(iii)භූගෝලීය තොරතුරු පද්ධතිවල වැදගත්කම තවදුරටත් වර්ධනය වීම කෙරෙහි බල පෑ සාධක **දෙකක්** විස්තර කරන්න (ලකුණු 04)

(iv)භූගෝලීය තොරතුරු පද්ධතියක අඩංගු අවකාශීය හා අවකාශිය නොවන දත්ත උදාරණයක් සහිතව විස්තර කරන්න (ලකුණු 06)

06.(i)ගෝලීය ස්ථානගත කිරීමේ පද්ධතිය ආශ්‍රිත ප්‍රධාන තාක්ෂණික ක්‍රමවේදය කවරක් ද? (ලකුණු 02)

(ii)ගෝලීය ස්ථානගත කිරීමේ පද්ධතිය ආශ්‍රිත මූලික උපාංග **තුන** නම් කරන්න (ලකුණු 03)

(ii)ගෝලීය ස්ථානගත කිරීමේ පද්ධති භාවිතා කරන ක්ෂේත්‍ර **හතරක්** සඳහන් කරන්න (ලකුණු 04)

(iv)ගෝලීය ස්ථානගත කිරීමේ පද්ධතිය ආශ්‍රිත තාක්ෂණය රූප සටහනක් අධාර කරගනිමින් විස්තර කරන්න (ලකුණු 06)

**II කොටස** දෙවන ප්‍රශ්නයට අදාළ ලෝක සිතියම

